


# කඩල ආච්චී

මා කුමර දිවියේ දී උගත් ගමේ කණිෂ්ඨ පාසල එතරම් ලොකු පාසලක් නොවීය. එවකට තිබූ අධ්‍යාපන ක්‍රමය අනුව, එහි පන්ති පැවැත්වුණේ අටවෙනි වසර දක්වා පමණකි. අටවැන්නේ විභාගයෙන් සමත් වෙන්නන් තම ලකුණු මට්ටම් අනුව විද්‍යා, වාණිජ සහ කළා විෂයයන් සහිතව අපොස සාමාන්‍ය පෙළ හැදෑරීමට නගරයේ පාසල් කරා යෑම කළයුතු විය. එසේ නොකළේ අපේ ගමේ පන්සලේ තිබුණු දේවාලයේ කපු මහතා ගේ පුත්‍ර රත්නය පමණක් බව මගේ මතකයයි. ඔහු උසස් අධ්‍යාපනය වෙනුවට ගමේ මිනිසුන් ගේ මුග්ධත්වයෙන් යැපීම තෝරා ගත්තේය.

එකල මේ ආකාරයේ පාසල්වල කැන්ටින් නොතිබුණි. ඒ මක් නිසා ද යත් එක්සත් ජනපදයේ ආධාර ක්‍රමයක් යටතේ නිපදවුණු විස්කෝත්තු තුන බැගින් අපට විවේක කාලයේ දී නොමිලේ ලැබුණු හෙයිනි. ඇදිහැස (එනම්, ඇමරිකන් දීමනා හැමට සමානව) නමින් හැඳින්වුණු මේ විස්කෝත්තු වර්ගය රසයෙන් කෙසේ වුවද හැඩයෙන් නයිස් විස්කෝත්තු සේ විය. එකල බහුතරයක් පාසල් සිසුන් දිවා කාලයේ තම කුස පුරවා ගත්තේ මේ විස්කෝත්තුවල පිහිටෙනි.

විස්කෝත්තු කෑමෙන් පසු මා පානය කළේ අම්මා උදෑසන මිශ්‍රකර ප්ලාස්ටික් බෝතලයක් පුරවා දෙන හැලිබොරේන්ජ් නම් වූ කෝඩියල් වර්ගයයි.

ඒ සියල්ලම තිබුණද මගේ හිත ගියේ කලාතුරකින් දිනයක විවේක කාලය අවසාන වීමට සීනුව වැදීමට විනාඩි කිහිපයකට පෙර පාසලේ වැට අසලට එන ජංගම අයිස්පලම් කාරයා වෙත ය. දුරාවාරේ පැමිණෙන ඔහු මෙන් නොව සෑම සතියේ දිනකම පාසල අසලට කෑම බඳුනක් ද රැගෙන එන්නියක් ද වූවා ය. ඇය නම්, අප සියලු දෙනා විසින් කඩල ආච්චී නමින් හඳුන්වනු ලැබූ වයසක වෙළෙන්දියයි.

පාසල අසල නිවසක විසූ කඩල ආච්චී තැම්බූ කඩල සහිත බේසමක් ද රැගෙන විවේක කාලය ඇරඹීමට පෙර තම සැමියා වූ සීයා ද සමග පාසල අසලට එයි. සීයා කළේ පරණ ඇක්සයිස් පොත් කොළවලින් කෝණාකාර ගොටු ගැසීම පමණකි. අපෙන් මුදල් රැගෙන ගොටුව පිරෙන්නට හැන්දකින් කඩල පුරවා අප අතට පත්කර ගනුදෙනුව කරන්නේ කඩල ආච්චී ය. කඩල ගොට්ටක මිල ශත පහක් විය.

කඩල කෑමට තිබූ ආශාව කෙසේ වුවද මා කඩල ආච්චි ළඟට මුලින්ම ගියේ පාසල් යාම අරඹා දෙවසරක් පමණ ගතවීමෙන් පසු කාලයක දී බව මගේ මතකයයි.

එයට හේතු කීපයකි. හෝඩියේ පන්තියේ දී කුඩා අප දහවල් දොළහ වෙත්ම දවසේ ඉගෙනුම නිමවා නිවෙස් බලා යන බැවින් මුල් වසරේ කඩල කෑමට මට ඉඩ නොලැබුණි. ඉන් පසුව වුවද, කඩල කෑමට මා තුළ තරමක අකමැත්තක් ඇතිවෙන්නට හේතුවක් වූයේ කඩල ආච්චී සුදු කබර නම් වූ චර්ම රෝගය වැළඳී සිටි අයෙක් වීමයි. ඇගේ මුව ප්‍රදේශයේ සහ විශේෂයෙන් ම අත්වල මේ රෝග ලක්ෂණ දකින්නට ලැබීම, ඒ රෝගය පිළිබඳව කිසිදු වැටහීමක් නොමැති කුඩා දරුවෙකු වූ මට තරමක අප්‍රසන්න දෙයක් විය. එහෙත්, ගෙදරින් ශත පහක් ලැබීමට පින් කර තිබූ සිසුන් විවේක කාලයේ දී කඩල ආච්චී වටා රොක් වූයේ පොරි ගොඩකට පොර කන කුකුල් පැටවුන් රංචුවක් මෙනි. මා ද ක්‍රමයෙන් ගෙදරින් ලැබෙන ශත පහක් වෙතොත් එයින් කඩල කෑමට පුරුදු වුණෙමි.

එක් දිනයක මා අතින් ගත් තඹ පැහැති හතරැස් ශත පහේ කාසියද රැගෙන කඩල ආච්චී වටා පොරකමින් සිටි සිසුන් අතරට වැදුණෙමි. මේ ලංකාව පෝලිම් යුගයට පිවිසෙන්නට වසර දෙක තුනකට පෙර සමයයි. මුලින් එන්නාට මුල් තැන නොව අත දිග ඇත්තාට මුල් තැන ලැබීම මේ ආකාරයේ පොරකෑමේ ප්‍රතිඵලය විය.

කඩල පිරවූ බේසමට පිටුපසින් බිම වාඩිවී සිටින කඩල ආච්චී ගේ කෝණයෙන් බැලුවහොත් ඇයට ඉහළින් ඇය වෙත යොමු කෙරෙන කුඩා අත් රාශියකි. මේ බොහොමයක ශත පහේ කාසි රැඳී ඇත. සමහර අත්වල ඊට වඩා ලොකු කාසි ද තියෙන්නට ඇත. ඇය එක අතකින් ඇය වෙත දිගු කෙරෙන එක් කාසියක් ගත යුතුය. එය තම සල්ලි මල්ලට එක්කර ගෙන අවශ්‍ය නම් ඉතුරු සල්ලි දිය යුතුය. ඉන්පසු කඩල ගොට්ටක් රැගෙන එයට හැන්දෙන් කඩල පිරවිය යුතුය. දැන් මේ කඩල ගොට්ට තමන් සල්ලි ගත් අත මත තැබිය යුතුය. ඉන්පසු මේ ක්‍රියාවලියම ඊළඟට ඇය නෙත ගැටෙන කුඩා අත සමග කළ යුතුය.

එය සිදුවූයේ කෙසේ දැයි මම නොදනිමි. මම කඩල ආච්චී වගේ තුන් දිශාවලින් පොදිකමින්, තෙරපෙමින් සිටි සිසුන් පිරිස අතරට ගොස් මගේ ශත පහ ඇය වෙත දිගු කළෙමි. මද වේලාවකට පසු ඇය මගේ ශත පහ ගත්තාය. සමහර විට දිගු කරගෙන



**රසික සූරියආරච්චි**

සිටි මගේ අත කෙඩෙත්තුව නිසා තමරමක් පහත වැටෙන්නට ඇත. පෙර තිබූ ස්ථානයෙන් වෙනස් වන්නට ඇත. ඒ කෙසේ හෝ වේවා මා දන්නේ මගේ අතට කඩල ගොට්ටක් නොලැබුණු බව පමණකි.

දැන් ඉතින් කුමක් කරන්නද? දෙකේ පන්තියේ සිටි වයස හයක කුඩා දරුවෙකු වූ මා හට ඇඬුම් යන්නට ද ආසන්න විය.

මට කළ හැකිව තිබුණේ එකම එක දෙයකි. එනම් කඩල ආච්චී දෙසට අත දිගු කරගෙනම සිටීමයි. අන් සියලු දෙනාටම කඩල විකුණා අවසානයේ කඩල ආච්චී සහ සීයා යුවළ අසල ඉතුරු වූයේ මා පමණයි.

කඩල ඕනැද? ආච්චී ඇසුවාය.
මං ශත පහක් දුන්නා, කඩල ගොට්ටක් හම්බ වුණේ නෑ, මා හැඬුම්බර ස්වරය නොසඟවාම පිළිතුරු දුන්නෙමි.

කඩල ආච්චී කඩල බේසම දෙස බැලූවාය.
නැවත මගේ මුහුණ දෙස බැලූවාය.

ඉන්පසු කඩල ගොට්ටක් බෙදා මා අතට දුන්නාය.

සිංහල භාෂාවට තරමක ආගන්තුක වචනයක් වන ස්තුතියි යන්න එකල අපට උගන්වා තිබුණේ නැත. මා කඩල ගොට්ට රැගෙන ඉතා සතුටින් පිට්ටනිය දෙසට දිව ගියෙමි.

එදා කඩල ආච්චී සමහර සිතන්නට ඇත්තේ ඇය මට කඩල නොමිලේ දෙනවාය කියා විය යුතුයි. මා නිසැකවම සිතුවේ මට හිමි කඩල ගොට්ට අවසානයේ කෙසේ හෝ මට ලැබුණාය කියායි.

ඒ කෙසේ වෙතත්, ඉන් අවුරුදු හතළිස් හතරකට පසුව වුවද එදා මෙන් සිහිපත් කරන්නට හැකිවෙන පරිදි මේ සිදුවීම මගේ මතකයේ එදා රැඳුණි.

# මෙල්බන් නුවර ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම්මන්ත්‍රණය

මෙල්බන් නුවර ලන්ගහම් හොටෙල් (Langham Hotel) හිදී ජූනි 23 පැවති පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම්මන්ත්‍රනයදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතා සභාවෙන් නැගුණ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් .






විදේශ කටයුතු ඇමැති මහාචාර්ය ජී. එල් . පීරිස් , ලේකම් අනුර කුලසේකර , සම්බන්ධිකරන ලේකම් චන්ද්‍ර බමුනුසිංහ, සංවිධායක ශ්‍රීනාත් මද්දුමගේ යන මහත්වරුද සභාව ඇමතුවහ.

මෙල්බන් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රියන්ත මෙන්ඩිස් මහතා සම්මන්ත්‍රණය මෙහෙයෙව්වේය


